සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
Year End Evaluation

ශ්‍රේණිය / தரம் / Grade	විෂයය / பாடம் / Subject	පත්‍රය / வினாத்தாள் / Paper	කාලය / காலம் / Time
10	කෘෂි හා ආහාර තාක්ෂණය	I	පැය 01

සැලකිය යුතුයි:

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1 , 2 , 3 , 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

---

(01) හරිත විප්ලවය ආරම්භවීමත් සමඟ,

(1) පැරණි බෝග ප්‍රභේද සඳහා ඉල්ලුම වැඩි විය.
(2) ඒකීය ක්ෂේත්‍රඵලයකින් ලැබෙන අස්වනු ප්‍රමාණය වැඩි විය.
(3) කාබනික බෝග වගාවේ ප්‍රවර්ධනයට පසුබිම සකස් විය.
(4) වැවිලි බෝග ව්‍යාප්තිය වැඩි විය.

(02) වායව පරිසරයේ දෛනික උෂ්ණත්වය විචලනය වන ආකාරය පිළිබඳව දැනගැනීම සඳහා වඩාත්ම සුදුසු උපකරණය වන්නේ,

(1) සාමාන්‍ය උෂ්ණත්වමානය යි.
(2) තෙත් හා වියළි බල්බ උෂ්ණත්වමානය යි.
(3) උපරිම හා අවම උෂ්ණත්වමානය යි.
(4) පාංශු උෂ්ණත්වමානයයි.

(03) තෙත් කලාපයට මැයි හා ජූනි මාසවල දී වර්ෂාපතනය ලැබෙන ප්‍රධාන ආකාරය වන්නේ,

(1) පීඩන අවපාත මගිනි.
(2) නිරිත දිග මෝසම් සුළං මගිනි.
(3) ඊසාන දිග මෝසම් සුළං මගිනි.
(4) සංවහන ධාරා මගිනි.

(04) පෘථිවි අභ්‍යන්තරයේ පවතින මැග්මා, පෘථිවිය මතුපිටට පැමිණ සිසිල් වී, ඝනවීමෙන් සෑදෙන්නා වූ පාෂාණ වර්ගයකි,

(1) ග්‍රැනයිට් (2) ෂේල් (3) නයිස් (4) මාබල්

(05) පාංශු පැතිකඩක C කලාපයේ අඩංගු වන්නේ,

(1) කාබනික ද්‍රව්‍යයන් ය.
(2) මාතෘ පාෂාණ ය.
(3) මාතෘ ද්‍රව්‍යය ය.
(4) පාංශු ජලය ය.

(06) පස් සාම්පලයක් 0.2 mm සිදුරු සහිත පෙනේරයකින් හලාගත් විට පෙනේර තට්ටුව මත රැඳෙන පාංශු ඛණිජ සංඝටකය වන්නේ,

(1) සියුම් වැලි ය. (2) මැටි ය. (3) රොන් මඩ ය. (4) රළු වැලි ය.

(07) රට කජු වගා කිරීමට බලාපොරොත්තුවන ගොවි මහතෙකු බීජ සිටුවීම සඳහා සකස් කළ යුතු වන්නේ,

(1) තනි වගා වලවල් ය.
(2) උස් පාත්ති ය.
(3) ගිල් වූ පාත්ති ය.
(4) වැටි හා කාණු ය.

(08) මිරිස්, දොඩම් හා කරවිල යන බෝග අයත්වන ශාක කුල පිළිවෙලින්,

(1) සොලනේසියේ, රුටේසියේ, කුකර්බිටේසියේ
(2) පොඒසියේ, ෆැබේසියේ, කුකර්බිටේසියේ
(3) සොලනේසියේ, පොඒසියේ, අමරිලිඩේසියේ
(4) ඉයුෆෝබියේසියේ, මැල්වේසියේ, ඇරිකේසියේ

(09). ක්ෂේත්‍රයක පස පරීක්ෂා කළ විට එහි pH අගය 5.0ක් විය. එම ක්ෂේත්‍රයේ බෝගවලට ලබා ගැනීමට අපහසු ශාක පෝෂකය වන්නේ,

(1) යකඩ ය. (2) ඇලුමිනියම් ය. (3) මැංගනීස් ය. (4) පොස්පරස් ය.

(10) පසක් තද බවට පත්වීමට බලපාන හේතුවක් වන්නේ,

(1) බිම් සැකසීමට බර අඩු යන්ත්‍රෝපකරණ භාවිතය යි.
(2) එකම ගැඹුරට අඛණ්ඩව සී සෑම යි.
(3) ක්ෂේත්‍රයට වසුන් යෙදීම යි.
(4) රසායනික පොහොර බහුලව පසට යෙදීම යි.

(11) ද්විතියික බිම් සැකසීම සඳහා භාවිත කරන බිම් සැකසීමේ උපකරණ පමණක් වන්නේ,

(1) තැටි නගුල, උදැල්ල හා රේක්කය යි.
(2) රේක්කය, රිජරය හා අත් පෝරුව යි.
(3) අත් මුල්ලුව, උදැල්ල හා රොටරි වීඩරය යි.
(4) ගැමි ලී නගුල, තල පෝරුව හා උදැල්ල යි.

(12) තවාන් පිළිබඳව වගන්ති කිහිපයක් පහත දැක්වේ.

A - නොරිදෝකෝ තවාන්වල ඇති ශාක මුල්වලට සිදුවන හානිය අවම වේ.
B - උස් පාත්තියක සම්මත පළල 45 cm කි.
C - තවානේ දී බීජ පැළවලට රෝග බෝවීම වැළැක්වීම සඳහා තවානේ බීජ සංස්ථාපනය කිරීමට පෙර තවාන් මිශ්‍රණයට දිලීර නාශකයක් මිශ්‍ර කරනු ලැබේ.

ඉහත වගන්ති අතරින් නිවැරදි වන්නේ,

(1) A පමණි ය. (2) B පමණි ය. (3) C පමණි ය. (4) A හා C පමණි ය.

(13) බීජ වැපිරීම සිදු කරනු ලබන බෝග වර්ග පමණක් දැක්වෙන පිළිතුර වන්නේ,

(1) වී, තල හා මෙනේරි ය. (2) තල, කුරක්කන් හා මිරිස් ය.
(3) මුං, බඩ ඉරිඟු හා කව්පි ය. (4) වී, බඩ ඉරිඟු හා බටටක්කා ය.

(14) ගැමි ලී නගුල,

(1) යන්ත්‍ර බලයෙන් ක්‍රියා කරන ප්‍රාථමික බිම් සැකසීමේ උපකරණයකි.
(2) සත්ත්ව බලයෙන් ක්‍රියා කරන ප්‍රාථමික බිම් සැකසීමේ උපකරණයකි.
(3) යන්ත්‍ර බලයෙන් ක්‍රියා කරන ද්විතියික බිම් සැකසීමේ උපකරණයකි.
(4) සත්ත්ව බලයෙන් ක්‍රියා කරන ද්විතියික බිම් සැකසීමේ උපකරණයකි.

(15) කාර්යක්ෂම ලෙස ජලය සමඟ පොහොර ක්ෂේත්‍රයට යෙදීම සඳහා සුදුසු ජල සම්පාදන ක්‍රමය වන්නේ,

(1) පිටාර ජල සම්පාදනය යි. (2) සවිවර නල වැළලීම යි.
(3) බිංදු ජල සම්පාදනය යි. (4) තීරු ජල සම්පාදනය යි.

(16) දුර්වල ජලවහනය හේතුවෙන් සිදුවිය හැකි බලපෑම් පිළිබඳ ශිෂ්‍යයෙක් ඉදිරිපත් කළ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - පාංශු වාතනය දුර්වල වීම.

B - ස්වායු ජීවීන්ගේ ක්‍රියාකාරීත්වය වැඩි වීම.

C - කෘෂි උපකරණ භාවිතය අපහසු වීම.

ඉහත ප්‍රකාශ අතරින් සත්‍ය වන්නේ,

(1) A පමණි ය. (2) B පමණි ය. (3) C පමණි ය. (4) A හා C පමණි ය.

(17) වර්ෂාමානයක් ස්ථාපනය කිරීමේ දී, පුනීල කට පොළොව මට්ටමේ සිට තැබිය යුතු උස ප්‍රමාණය කොපමණ ද?

(1) 50 cm ක උසකිනි. (2) 20 cm ක උසකිනි.

(3) 30 cm ක උසකිනි. (4) 40 cm ක උසකිනි.

(18) ශ්‍රී ලංකාවේ කෘෂි දේශගුණික කලාප වර්ගීකරණයේ දී WU ලෙස හඳුන්වන්නේ,

(1) මැදරට තෙත් කලාපය යි. (2) උඩරට තෙත් කලාපය යි.

(3) පහතරට තෙත් කලාපය යි. (4) උඩරට අතරමැදි කලාපය යි.

(19) පහත දැක්වෙන්නේ ශාක පෝෂක වර්ග, ශාක තුළ ඉටුකරන කාර්යය පිළිබඳ සිසුවෙක් ඉදිරිපත් කළ සටහනකි.

	පෝෂකය	ශාක දේහය තුළ ඉටුකරන කාර්යය
A	නයිට්‍රජන්	පුෂ්ප හා ඵල හටගැනීමට දායක වේ.
B	පොස්පරස්	ශාකය තුළ ශක්ති හුවමාරුවට උපකාරී වේ.
C	පොටෑසියම්	පත්‍ර හා මුල් වර්ධනයට උපකාරී වේ.

එක් එක් පෝෂකය මගින් ශාකය තුළ ඉටුකරන කාර්යය නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) A පමණි (2) B පමණි

(3) A හා B පමණි (4) A, B හා C යන සියල්ල සත්‍ය වේ.

(20) එක්තරා මිරිස් වගාවක පහත සඳහන් ඌනතා ලක්ෂණ දක්නට ලැබුණි.

- ශාක වර්ධනය දුර්වල ය.
- මේරූ ශාක පත්‍ර කහ පැහැති ය.
- සෑදෙන මල් හා ඵල විකෘති ය.
- අස්වැන්න අඩු ය.

මෙම මිරිස් වගාවට යෙදිය යුතු පොහොර වර්ගය වන්නේ,

(1) යූරියා ය. (2) මියුරියේට් ඔෆ් පොටෑෂ් ය.

(3) ඩොලමයිට් ය. (4) ත්‍රිත්ව සුපර් පොස්පේට් ය.

(21) පොහොර භාවිත කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා,

(1) පස වියළි අවස්ථාවේ දී පොහොර යෙදිය යුතු ය.

(2) අධික වර්ෂාව පැවතිය ද පොහොර යෙදිය යුතු ය.

(3) කාබනික පොහොර යොදා, පාංශු ව්‍යුහය යහපත් වූ පසු, රසායනික පොහොර යෙදිය යුතු ය.

(4) සෑම කන්නයක් ආරම්භයේ දීම රසායනික පොහොර මිශ්‍රණයක් යෙදිය යුතු ය.

(22) එක්තරා වල් පැළෑටි වර්ගයක පහත සඳහන් ලක්ෂණ දක්නට ලැබුණි.

- කඳ සිලින්ඩරාකාර ය.
- ඇතුළත කුහර සහිත ය.
- කඳ අග්‍රස්ථයේ පුෂ්ප මංජරියක් හට ගනී.
- සිහින් පත්‍ර ඇති තන්තු මුල් පද්ධතියක් ඇත.

එම වල් පැළෑටි වර්ගය විය හැක්කේ,

(1) මාරුක් ය. (2) ගඳපාන ය. (3) කුඩමැට්ට ය. (4) තුනැස්ස ය.

(23) පහත දැක්වෙන්නේ කෘමීන්ගේ දැකිය හැකි රූපාන්තරණ ආකාරයකි.



මෙම ආකාරයේ රූපාන්තරණයක් පෙන්වන කෘමියෙක් වන්නේ,

(1) අවුලකපෝරා ය. (2) ගොයම් මකුණා ය.

(3) කුඩිත්තා ය. (4) පළගැටියා ය.

(24) පහත දැක්වෙන්නේ පළතුරු වගාවකට වැළඳුණු රෝගයක, රෝග ලක්ෂණ කිහිපයකි.

- පත්‍ර මත අක්‍රමවත් දුඹුරු කළු පුල්ලි ඇති වීම.
- එම පුල්ලි එකතු වී, කළු දුඹුරු පාට විශාල පුල්ලි ඇති වීම.
- ඵල මත ජලය උරාගත් පෙනුමැති රවුම් පුල්ලි ඇති වී, පසුව කළු දුඹුරු පැහැති වීම.

මෙම රෝගය සහ පාලන ක්‍රමය නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ,

(1) දියමලංකෑම - ආසාදිත පත්‍ර පිළිස්සීම.

(2) ඇන්ත්‍රැක්නෝස් - ආසාදිත පත්‍ර හා රිකිලි කප්පාදු කර පිළිස්සීම.

(3) හිටු මැරීම - පස පිළිස්සීම.

(4) පත්‍ර විචිත්‍ර රෝගය - බෝග මාරුව.

(25) සුවඳැල්, කළු හීනැටි හා රත්දැල් යන වී ප්‍රභේද,

(1) වැඩි අස්වැන්නක් ලබා දෙයි.

(2) බොහෝ රෝග හා පළිබෝධ සඳහා ඔරොත්තු දෙයි.

(3) රසායනික පොහොරවලට වැඩි ප්‍රතිචාරයක් පෙන්වයි.

(4) අධික ලෙස පඳුරු දැමීම සිදු වෙයි.

(26) පළිබෝධ පාලන ක්‍රම අතරින්, යාන්ත්‍රික ක්‍රමයක් වන්නේ,

(1) නිවැරදි පරතර තබා බෝග සිටුවීම යි.

(2) රෝගී ශාක කොටස් අතින් කඩා ඉවත් කිරීම යි.

(3) වල් පැළෑටි ආහාරයට ගන්නා ජීවීන් යොදා ගැනීම යි.

(4) වල් පැළෑටි බීජවලින් තොර වූ බීජ, භාවිත කර වගා කිරීම යි.

(27) වී බෝගය පීදීමේ සිට අස්වනු මේරීම දක්වා ගතවන කාලය වන්නේ,

(1) දින 20 කි. (2) දින 30 කි.

(3) දින 40 කි. (4) දින 50 කි.

(28) ඩැපොග් තවානක ඇති ගොයම් පැළ, දින 10 - 12 අතර කාලය තුළ දී ක්ෂේත්‍රයේ සිටුවනු ලැබේ; එයට හේතුව වන්නේ දින 12කට පසුව,
(1) වී ශාකය පඳුරු දැමීම ආරම්භ කිරීම යි. (2) බීජයේ සංචිත ආහාර හිඟවීම යි.
(2) පුෂ්ප මූලාකෘති සෑදීම යි. (4) පැළ ගැලවීම අපහසු වීම යි.

(29) බීජ වැපිරීම සඳහා යොදාගත හැකි උපකරණයක් වන්නේ,
(1) රොටවේටරය යි. (2) බීජ වප්කරය යි.
(3) නැප්සැක් ඉසිනය යි. (4) ඇලි වැටි දමනය යි.

(30) ගොඩ ක්‍රමයට කොම්පෝස්ට් සෑදීමේ දී, කොම්පෝස්ට් ගොඩ පෙරලීම සිදු කිරීමේ ප්‍රධාන අරමුණ වන්නේ,
(1) ඉක්මනින් දිරාපත් කර ගැනීම යි.
(2) විෂ වායු ඉවත් කර ගැනීම යි.
(3) හානි සිදු කරන ජීවීන් විනාශ කර ගැනීම යි.
(4) උෂ්ණත්වය පාලනය කර ගැනීම යි.

(31) සූර්යාලෝකය මගින් තවාන් ජීවානුහරණයේ දී, සූර්යාලෝකයට තවාන නිරාවරණය කර තැබිය යුතු කාලය වන්නේ,
(1) සති 1 කි. (2) සති 2 කි. (3) සති 3 කි. (4) සති 4 කි.

(32) කුඹුරේ නියර මත සවිකිරීමෙන්, ජලවහනය කිරීම සඳහා යොදා ගතහැකි උපකරණයකි,
(1) දිය හොල්මන (2) පෙරමෝන උගුල
(3) පද්දන ඔරුව (4) හෝව

(33) නිවිති මුල් ගැට රෝගය ඇති කරනු ලබන රෝග කාරකයා වන්නේ,
(1) දිලීරයකි. (2) බැක්ටීරියාවකි. (3) වෛරසයකි. (4) වට පණුවෙකි.

(34) 
මෙම රූපයෙන් පෙන්නුම් කරන පළිබෝධකයා වන්නේ,
(1) එපිලැක්නා කුරුමිණියා ය.
(2) අවුලකපෝරා කුරුමිණියා ය.
(3) පළතුරු මැස්සා ය.
(4) ඉල් මැස්සා ය.

(35) පිදුරු පිළිස්සීමෙන් වැලකී, ඒවා කුඹුරට යොදා දිරාපත්වීමට සලස්වන ලෙස උපදෙස් ලබා දෙනුයේ,
(1) ඒවා පිළිස්සීමෙන් පරිසරය දූෂණය වන නිසාය.
(2) පිදුරු කුඹුරට යෙදීමෙන් පාංශු ව්‍යුහය දියුණුවන නිසාය.
(3) පිළිස්සීම නිසා හිතකර පාංශු ජීවීන් විනාශවන නිසාය.
(4) පිළිස්සීම නිසා ලැබෙන අළු, ශාකවලට විෂවන නිසාය.

(36) ආක්‍රමණශීලී වල් පැළෑටි කාණ්ඩයට අයත් වන්නේ,
(1) මොණරකුඩුම්බිය, ඇටවරා, විඩේලියා ය. (2) ගඳපාන, පාතේනියම්, විඩේලියා ය.
(3) ජපන් ජබර, බටදැල්ල, කුඩමැට්ට ය. (4) ඇටවරා, කලාඳුරු, මාරුක් ය.

(37) කුකර්බිටේසියේ කුලයේ ඵලවලට හානිකරන කෘමියෙකි,
(1) අවුලකපෝරා. (2) ඉල් මැස්සා.
(3) පුරුක් පණුවා. (4) පිටි මකුණා.

(38) කෙසෙල් ශාකවල පත්‍ර සිහින් වී, වර්ධනය බාල වී, වඳ පිදීම සිදුවන්නේ,
(1) වඳ පිදීමට හේතුවන වෛරසය කුඩිත්තන් මගින් පැතිරීමෙනි.
(2) පෝෂණ සංඝටකවල ඌනතාවයක් හේතුවෙනි.
(3) වඳ පිදීමට හේතුවන බැක්ටීරියාවක් කෘෂි උපකරණ මඟින් ඇතුළුවීමෙනි.
(4) මුල්වලට ඇතිවන වටපණු හානිය හේතුවෙනි.

(39) ශ්‍රී ලංකාවේ අභිජනනය කළ පළමු දෙමුහුම් වී ප්‍රභේදය වන්නේ,
(1) BG 300 ය. (2) BG 450 ය. (3) H4 ය. (4) BW 351 ය.

(40) ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ආරම්භ කරන ලද්දේ, වර්ෂ
(1) 1920 දී ය. (2) 1912 දී ය. (3) 1910 දී ය. (4) 1918 දී ය.

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
Year End Evaluation

ශ්‍රේණිය / தரம் / Grade: 10	විෂයය / பாடம் / Subject: කෘෂි හා ආහාර තාක්ෂණය	පත්‍රය / வினாத்தாள் / Paper: II	කාලය / காலம் / Time: පැය 02

සැලකිය යුතුයි:
- **පළමු ප්‍රශ්නය** හා **තවත් ප්‍රශ්න හතරක්** ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

(01) මේ දිනවල ශ්‍රී ලංකාවේ බොහෝ ප්‍රදේශවලට බලපා ඇති නියං තත්ත්වය හේතුවෙන් යල කන්නයේ වගා කටයුතු ආරම්භ කිරීමට අසීරු තත්ත්වයක් උදා වී ඇති බව ගොවි සංවිධාන පවසයි. (2017 මැයි මස පුවත් පතකින් උපුටා ගැනීමකි.)

(i) (a) යල කන්නය ලෙස සැලකෙන කාල සීමාව සඳහන් කරන්න.

(b) මෙම කන්නයේ දී වැඩිපුර වර්ෂාපතනය ලැබෙන්නේ, ශ්‍රී ලංකාවේ කුමන දේශගුණික කලාපයට ද?

(ii) (a) යල කන්නය සඳහා වර්ෂාව ලැබෙන ප්‍රධාන ආකාර දෙකක් නම් කරන්න.

(b) මෙම කාලයේ දී පරිසරයේ පවතින අධික උෂ්ණත්වය, බෝග වගාවට බල පෑ හැකි ආකාරයක් සඳහන් කරන්න.

(iii) (a) මෙම කාලයේ දී බෝග සඳහා ජලය සම්පාදනය කිරීමට උචිත ජල සම්පාදන ක්‍රම දෙකක් සඳහන් කරන්න.

(b) පසේ පවතින ජලය සංරක්ෂණය කර ගැනීමට යොදා ගත හැකි උපක්‍රම දෙකක් සඳහන් කරන්න.

(iv) බෝග වගා කළ පසු වර්ෂාපතනය අධිකව ඇති වුවහොත් එමගින් වගාවට සිදුවන අහිතකර බලපෑම් දෙකක් දක්වන්න.

(v) (a) වියළි තත්ත්ව යටතේ පසේ තද බව වැඩි ය. එවිට මූලික බිම් සැකසීම සඳහා යොදා ගැනීමට උචිත යන්ත්‍ර බලයෙන් ක්‍රියාකරන උපකරණයක් සඳහන් කරන්න.

(b) බෝග වගාවේ දී බීජ හෝ පැළ සිටුවීම සඳහා සකස් කර ගන්නා පාත්ති වර්ග දෙකක් සඳහන් කරන්න.

(vi) (a) අහිතකර පරිසර තත්ත්ව යටතේ වී බීජ තවාන් දැමීම සඳහා සුදුසු තවාන් වර්ගයක් සඳහන් කරන්න.

(b) ඔබ සඳහන් කළ ක්‍රමයේ දී, තවාන් පැළ ක්ෂේත්‍රයේ සංස්ථාපනය කරන ආකාරය දක්වන්න.

(vii) නියං කාලයේ දී නොනැසී පවතින තෘණ වර්ගයේ වල් පැළෑටි වර්ගයක් නම් කර, එය නොනැසී පැවතීමට හේතුවක් සඳහන් කරන්න.

(viii) වගා කටයුතු සඳහා කාබනික පොහොර නිෂ්පාදනය කර ගැනීමට අවශ්‍ය වන්නේ නම්, ඒ සඳහා යොදාගත හැකි ක්‍රම දෙකක් දක්වන්න.

(ix) බෝග වගාව සඳහා කාබනික පොහොර භාවිතයේ වාසි දෙකක් සඳහන් කරන්න.

(x) බෝග වගාවේ දී, ඇතිවන කෘමි හානි පාලනය සඳහා යොදාගත හැකි පරිසර හිතකාමී පළිබෝධනාශක දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2 × 10 = 20)

(02) වර්තමානයේ ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය, දේශීය හා විදේශීය වෙළෙඳපොළ ඉලක්ක කරගත් වාණිජ කෘෂිකර්මය මෙන්ම, ගෙවතු වගා සංවර්ධනය කෙරෙහි ද යොමු වී ඇත.

(i) අපනයනය අරමුණු කරගෙන සිදු කරන සාම්ප්‍රදායික නොවන කෘෂි ව්‍යාපාර දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) ශ්‍රී ලංකාවේ සංවර්ධනයට කෘෂි අංශයේ දායකත්වය ලබා දෙන ආකාර හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) (a) ශ්‍රී ලංකාව තුළ ආහාර සුරක්ෂිතතාවය වැඩි දියුණු කිරීමට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග දෙකක් දක්වන්න. (ලකුණු 02)

(b) විදේශ ආක්‍රමණ නිසා කෘෂි ආර්ථිකයේ සිදු වූ වෙනස්කම් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(03) බෝග වගාවේ දී, බෝග වගාව සඳහා උපස්තරය සැපයීම හා බෝගවලට අවශ්‍ය පෝෂක හා ජලය සැපයීම ද පස මගින් සිදු වේ.

(i) පස නිර්මාණය වීමේ දී, පාෂාණවල භෞතික ජීරණයට බලපාන සාධක තුනක් ලියන්න. (ලකුණු 03)

(ii) පාංශු වයනය කෘෂිකාර්මික කටයුතුවල දී වැදගත්වන ආකාර තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) (a) පාංශු හායනයට බලපාන හේතු තුනක් දක්වන්න. (ලකුණු 03)

(b) පාංශු පුනරුත්ථාපනය යනු කුමක් ද? (ලකුණු 01)

(04) පාසල් අධ්‍යාපනය නිමා කළ සිසුවෙක් ස්වයං රැකියාවක් ලෙස තවානක් ඇරඹීමට අපේක්ෂා කරයි.

(i) ඔහු විසින් තවාන සෑදිමට ස්ථානයක් තේරීමේ දී සැලකිය යුතු කරුණු තුනක් දක්වන්න. (ලකුණු 03)

(ii) (a) ඔහුට සකස් කරගත හැකි තවාන් පාත්ති වර්ග දෙකක් සඳහන් කරන්න. (ලකුණු 01)

(b) තවාන් සැකසීමේ දී යොදා ගනු ලබන තවාන් මිශ්‍රණය හා අනුපාතය දක්වන්න. (ලකුණු 02)

(iii) (a) තවාන් පාත්ති දැමීමට අමතරව යොදාගත හැකි විවිධ තවාන් වර්ග දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(b) තවාන් ජීවානුහරණය කිරීමට යොදාගත හැකි ක්‍රම දෙකක් දක්වන්න. (ලකුණු 02)

(05) වගා ක්ෂේත්‍රයක පහත සඳහන් A, B, C පළිබෝධ කාණ්ඩ දක්නට ලැබුණි.

A	B	C
ගොළුබෙල්ලා	හිටුමැරීම	ජපන් ජබර
පළතුරු මැස්සා	තෘණාකාර කුරුවීම	කළාඳුරු
මයිටාවන්	මුල් ගැට රෝගය	බට දැල්ල

(i) පහත සඳහන් නිර්ණායකවලට අදාළ පළිබෝධ වර්ග ඉහත දැක්වෙන පළිබෝධ කාණ්ඩ අතරින් තෝරා දක්වන්න.

(a) කෘමි පළිබෝධකයෙකි - ....

(b) ෆයිටොප්ලස්මා රෝග කාරකය මගින් ඇතිවන රෝගයකි. - ....

(c) බහුවාර්ෂික වල් පැළෑටියකි - ....

(d) යුෂ වැස්සීමේ පරීක්ෂාව මඟින් හඳුනාගන්නා රෝගයකි. - ....

(ලකුණු 04)

(ii) (a) පළතුරු මැස්සා හා ගොළුබෙල්ලා පාලනය සඳහා යොදාගත හැකි පරිසර හිතකාමී ක්‍රමයක් බැගින් දක්වන්න. (ලකුණු 02)

(b) හිටුමැරීමේ රෝගය බහුලව වැළඳෙන ශාක දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(iii) C පළිබෝධ කාණ්ඩයෙන් වගා ක්ෂේත්‍රයට ඇතිවන හානි හතරක් සඳහන් කරන්න. (ලකුණු 02)

(06) බෝග වගාවේ ඵලදායීතාවය වැඩිකර ගැනීමට පසට පොහොර යෙදීම සිදු කළ යුතු වේ.

(i) (a) බහුලව භාවිත කරන කාබනික පොහොර වර්ග හතරක් ලියන්න. (ලකුණු 02)

(b) කාබනික පොහොර යෙදීමේ වැදගත්කම් හතරක් ලියන්න. (ලකුණු 02)

(ii) නිතර භාවිතයට ගන්නා රසායනික පොහොර වර්ග කීපයක් පහත දක්වා ඇත. එම වගුවේ හිස්තැන් පුරවන්න.

	පොහොර වර්ග	පෝෂක ප්‍රතිශතය	භෞතික ලක්ෂණ
(a)	යූරියා	N - 46%	....
(b)	....	K_2O - 60%	රතු දුඹුරු පැහැ ස්ඵටික
(c)	ත්‍රිත්ව සුපර් පොස්පේට්	....	ලා අළු පැහැතිය.

(ලකුණු03)

(iii) (a) පසට පොහොර යොදන ක්‍රම තුනක් ලියා දක්වන්න. (ලකුණු 1 1/2)

(b) පොහොර යෙදීමේ දී සලකා බැලිය යුතු කරුණු තුනක් සඳහන් කරන්න. (ලකුණු 1 1/2)

(07) ශ්‍රී ලංකාවේ ගොවි ජනතාවගෙන් වැඩි කොටසක් වී ගොවිතැනේ නිරතව සිටිති.

(i) (a) වී වගාව සඳහා රජය ලබාදෙන අනුග්‍රහයන් තුනක් සඳහන් කරන්න. (ලකුණු 1 1/2)

(b) ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති වී පර්යේෂණ ආයතන පිහිටි නගර තුනක් නම් කරන්න. (ලකුණු 1 1/2)

(ii) (a) වී ශාකයේ ප්‍රධාන වර්ධන අවධි තුන නම් කරන්න. (ලකුණු 3)

(b) වී බෝගය ක්ෂේත්‍රයේ සංස්ථාපනය කරන ප්‍රධාන ක්‍රම දෙක සඳහන් කරන්න. (ලකුණු 2)

(iii) පහත සඳහන් පාංශු හා වායව පාරිසරික තත්ත්ව, වී වගාවට අහිතකරව බලපාන ආකාරය පැහැදිලි කරන්න.

(a) වැලි සහිත පසක් වීම.

(b) අධික වර්ෂාපතනයකට ලක්වීම. (ලකුණු 2)